


# තේ තතු

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
SALUS UNITAS NOSTRA
INCORPORATED
1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ප්‍රකාශණයකි

පළමුවෙනි කාණ්ඩය, පළමුවෙනි කලාපය 2001 ජනවාරි - ජූනි


## තේ දළු නෙලන කතුර

තේ වගාවේදී වියදමින් 60% පමණ ම වැය වන්නේ දළු නෙලීමේ කාර්යය වෙනුවෙනි. එසේ වුව ද අවශ්‍ය මිනිස් ශ්‍රමය හිඟවීම නිසා බොහෝ වතුවල මෙන් ම කුඩා තේ වතු හිමියන් සතු වගාවන්වල ද දළු නෙලීම බරපතල ගැටළුවක් ව පවතී. නිසි කලට දළු නෙලීමට නොහැකිවීම නිසා දළු මේරීමෙන් නෙලාගත හැකි අස්වැන්න අඩු වී ආර්ථිකමය අවාසියක් සිදුවන අතර ම එම දළුවලින් නිපදවන තේ වල ගුණාත්මය ද අඩුවී මුළු රටට ම විශාල ආර්ථික අලාභයක් සිදුවේ.

මේ තත්ත්වයට විසඳුමක් සෙවීම සඳහා වසර ගණනාවක් තිස්සේ කරන ලද පර්යේෂණවලින් අනතුරුව ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මගින් තේ දළු නෙලන කතුර හඳුන්වා දෙන ලදී. මෙය බරෙන් අඩු, පහසුවෙන් භාවිතා කළහැකි, දිගු කලක් පාවිච්චි කළහැකි, නොමේරූ දළු තෝරා නෙලිය හැකි කතුරකි. සාමාන්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් දළු නෙලිය හැකි අතර ඒ මගින් දළු නෙලීමේ වියදම අඩකින් අඩු කළහැකිය. එසේම නෙලූ දළුවලට කිසිදු හානියක් ද සිදුනොවේ. කෙසේ වුව ද දළු නෙලීමේ අවධියට ගෙන ඒමෙන් පසුව පළමු වසර දෙක තුලදී ද, වියළි මාස වලදී ද, මට්ටම් කැපීමෙන් පසු පළමු වසර තුලදී ද කතුර මගින් දළු නෙලීම යෝග්‍ය නොවේ.



තේ දළු නෙලන කතුර

කප්පාදු චක්‍රයේ තුන්වන වසරේ සිට කතුර යොදා දළු නෙලීම යෝග්‍ය වන අතර, කතුරෙන් දළු නෙලන අතරවාරයන්හි දී එක් අවස්ථාවක් අතින් දළු නෙලීම ගසේ පැවැත්මට මෙන්ම අස්වැන්න වැඩිවීමට ද හේතුවෙයි.

ටී.ජී.එන් මහින්ද